# 4

# මිල සහ වැටුප්

## 4.1 සමස්ත නිරීක්ෂණ

නිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2020 වසර තුළ දී අඩු වේගයකින් ඉහළ ගියේය. මේ සඳහා සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම ඇතුළු කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම උදෙසා ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සහ සේවා සඳහා වූ ඉල්ලුම පහළ යෑම හේතු විය. 2020 වසර ආරම්භයේ දී, සැලකිය යුතු ලෙස ඉහළ ගිය අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සහ සේවා බොහොමයක් ඇතුළත් වන ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්, ඉන් අනතුරුව වසර තුළ දී සුළු වශයෙන් පමණක් ඉහළ ගියේය. තවද, ගුවන් ගමන්, සෞඛ්‍ය සහ අධ්‍යාපන ගාස්තුවල කලින් කලට සිදු කරනු ලබන සංශෝධන 2020 වසරේ දී සිදු නොවුණු අතර, එමගින් පොදු මිල මට්ටමට හිතකර බලපෑමක් ඇති විය. මේ අතර, මිල ගණන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා රජය මගින් හඳුන්වා දුන් මිල පාලන ක්‍රියාමාර්ග පැවතිය ද, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2020 වසර පුරා කැපී පෙනෙන ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. 2019 වසර අග භාගයේ පැවති වැසි සහිත කාලගුණික තත්ත්වයත් සමඟ සිදු වූ වගා හානි හේතුවෙන් සැපයුම් තත්ත්වයන්ට ඇති වූ අහිතකර බලපෑම තුළින්, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ මිල ගණන් 2020 වසර ආරම්භයේ දී ඉහළ ගිය අතර, ඉන් අනතුරුව වසර තුළ දී මිශ්‍ර විචලන පෙන්නුම් කරන ලදී. මේ අතර, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් ආහාර අයිතමයන්හි මිල, 2020 වසරේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, නිල මිල දර්ශකයන්හි සංයුතියෙහි විශාලතම කොටස වන ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල සිදු වූ සුළු මිල ඉහළ යෑම් හේතුවෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම මගින් පොදු මිල මට්ටම මත ඇති වූ දැඩි බලපෑම යම්තාක් දුරකට සමනය විය. මේ අතර, 2020 වසර තුළ දී කොවිඩ්-19 වසංගතයෙහි අහිතකර බලපෑම් මධ්‍යයේ සියලුම අංශවල නාමික වැටුප් ඉහළ ගිය ද පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ ගියේය. මෙලෙස අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යන ලද්දේ 2012 වසරින් පසු පළමු වරටය. එසේ වුවද, විශ්‍රාම වැටුප් සඳහා සලකා නොබලන රුපියල් 2,500ක නව මාසික අතුරු දීමනාවක් ලබාදීම සහ විශේෂ දීමනාවේ හා අතුරු දීමනාවේ අවසන් වාරිකය මූලික වැටුපට එකතු කිරීම සමඟ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 2020 වසරේ දී ඉහළ ගියේය.

## 4.2 මිල

### පොදු මිල මට්ටමේ විචලන

**දේශීය වෙළඳපොළ තුළ ආහාර නොවන අයිතම සඳහා අඩු ඉල්ලුමක් පැවති හෙයින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2020 වසර තුළ දී ආහාර කාණ්ඩයේ අයිතමවල මිල හැසිරීමට බොහෝ සෙයින් අනුරූප විය.** ඒ අනුව, 2020 ජනවාරි මාසයේ දී ඉහළ ගිය පොදු මිල මට්ටම අප්‍රේල් මාසය වන තෙක් පහළ ගිය අතර ඉන් අනතුරුව නැවතත් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. 2020 වසර තුළ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල හැසිරීම මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, රට වසා දැමූ කාල සීමාව තුළ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවා සඳහා පැවති අඩු ඉල්ලුම සංකේතවත් කරමින් ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් සුළු වෙනස්වීම් පෙන්නුම් කළේය. එබැවින්, ජනවාරි සිට මාර්තු දක්වා කාල සීමාව තුළ ඉහළ යැමක් පෙන්නුම් කළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2020 අප්‍රේල් සිට ජූනි දක්වා කාල සීමාව තුළ පුළුල් වශයෙන් ස්ථාවර හැසිරීමක් පෙන්නුම් කළේය. එසේ වුවද, 2020 අගෝස්තු මාසයේ සෞඛ්‍ය උප කාණ්ඩයේ නිරීක්ෂණය කළ මිල අඩු වීම මධ්‍යයේ වුවද, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන (බස් ගාස්තු) සහ රෙදිපිළි සහ පාවහන් උප කාණ්ඩවල දක්නට ලැබුණු මිළ ඉහළ යැම් හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්වල ඉහළ යැමක් 2020 ජූලි මාසයේ සිට දක්නට ලැබුණි.

**2020 වසර මුළුල්ලේම සහල්, පොල්, එළවළු, ළූණු සහ අර්තාපල් මිල ගණන් මගින් නිතර මිල උච්චාවචනය වන ආහාර[2] කාණ්ඩයේ හැසිරීමට සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ලදී.** ඒ අනුව, 2019 වසර අග භාගයේ පැවතුණු වැසි සහිත කාලගුණික තත්ත්වයත් සමඟ සිදු වූ වගා හානි හේතුවෙන් 2020 වසර ආරම්භයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගිය අතර, ඉන් අනතුරුව 2020 මැයි දක්වා පහළ ගිය එම කාණ්ඩයේ අයිතමවල මිල ගණන් එතැන් සිට නැවතත් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. 2020 වසරේ ජනවාරි මාසයේ දක්නට ලැබුණු නිතර මිල උච්චාවචනය වන අයිතමවල මිල ගණන්හි ඉහළ යැමට එළවළු, පොල් සහ රතු ළූණු මිල ගණන් ඉහළ යැම ප්‍රධාන වශයෙන් දායක විය. 2019 අප්‍රේල් මාසයේ පටන් අඛණ්ඩව ඉහළ ගිය නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් 2020 පෙබරවාරි සිට මැයි දක්වා කාලසීමාව තුළ පහළ යන ලදී. සහල්, එළවළු, ළූණු, ලොකු මාළු සහ අමු මිරිස් මිල ගණන් පහළ යැම, 2020 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ හැසිරීමට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලද අතර, 2020 මැයි මාසයේ දී, පොල්, පලතුරු, අර්තාපල් සහ රතු ළූණු මිල ගණන් පහළ ගිය අතර සහල්, එළවළු, නැවුම් මත්ස්‍ය හා මස් වර්ගවල මිල ගණන්හි ඉහළ යැමක් දක්නට ලැබුණි. සහල්, එළවළු, නැවුම් මත්ස්‍ය සහ කුකුල් මස් මිල ගණන්හි සිදු වූ ඉහළ යැම 2020 ජූනි මාසයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ දක්නට ලැබුණු මිල ඉහළ යැම් සඳහා බොහෝ දුරට හේතු විය. මෙම ඉහළ යැමේ ප්‍රවණතාව, 2020 ජූලි මාසයේ දී සහල්, පොල්, එළවළු සහ ළූණු යන අයිතමවල මිල පහළ යැම හේතුවෙන් අපගමනය විය. කෙසේ වුවද, සහල්, එළවළු, පොල්, ලොකු ළූණු සහ අර්තාපල් යන අයිතමවල මිල ඉහළ යැම් හේතුවෙන් 2020 වසරේ ඉතිරි කාලයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල මිල මට්ටම ඉහළ ගිය අතර, පලතුරු මිල ඉහළ යැම මගින් ද අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී සිදු වූ මිල ඉහළ යැම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. 2020 වසරේ දී නැවුම් මත්ස්‍ය මිල ගණන් පෙර වසරවලට බොහෝ සෙයින් අනුරූපව හැසිරුණු නමුත්, 2020 ඔක්තෝබර් අවසානයේ දී පෑලියගොඩ මත්ස්‍ය වෙළඳපොළ ආශ්‍රිතව ඇති වූ කොවිඩ්-19 වසංගත පොකුර හඳුනා ගැනීමත් සමඟ මාළු මිල ගණන්හි සැලකිය යුතු පහළ යැමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, වසංගත තත්ත්වය පාලනය කිරීමත් සමඟ වෙළඳ කටයුතු යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් නැවුම් මත්ස්‍ය මිල ගණන් 2020 දෙසැම්බර් මාසයේ දී යම්තාක් දුරකට යථා තත්ත්වයට පත්විය. එමෙන්ම, දෙහි සහ අමු මිරිස් මිල, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් 2020 වසර තුළ දී ඇති කරන ලදී.

**මිල පාලනය කිරීම් මගින් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා 2020 වසරේ දී**

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

**4.1 රූප සටහන**
**මිල සහ වැටුප් විචලන - 2020**




(අ) වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස මගින් මනිනු ලබන ජා.පා.මි.ද. මිල.
(ආ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස්වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.
(ඇ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.
(ඈ) වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස මගින් මනිනු ලබන නාමික වැටුප්.
(ඉ) වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස මගින් මනිනු ලබන මූර්ත වැටුප්.

රජය විසින් සැලකිය යුතු පරිශ්‍රමයක් දරන ලදී. සහල් මිල ගණන්වල දක්නට ලැබුණු ඉහළ යෑම් අඩු කිරීමේ අරමුණින්, 2020 අප්‍රේල් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි සම්බා සහ නාඩු සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 90ක් සහ කැකුළු සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 85ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලද අතර, 2020 මැයි 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි එම මිල ගණන් නැවතත් පිළිවෙළින් කිලෝග්‍රෑමයක් මත රුපියල් 98, රුපියල් 96 සහ රුපියල් 93 දක්වා ඉහළ නංවන ලදී. පසුව, සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීමේ අරමුණින් 2020 නොවැම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි සම්බා, නාඩු සහ කැකුළු සහල් කිලෝග්‍රෑමයක් මත පිළිවෙළින් රුපියල් 94, රුපියල් 92 සහ රුපියල් 89 වශයෙන් උපරිම තොග මිලක් පනවන ලදී. කෙසේ වුවද, යල අස්වැන්න වෙළඳපොළට ලැබෙමින් පැවතිය ද, 2020 වසර අග භාගයේ දී සම්බා සහල් සැපයුමේ අඩුවක් දක්නට ලැබුණි. සහල් මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීමට රජය ගත් උත්සාහයන් මධ්‍යයේ වුවද, 2020 සැප්තැම්බර් මාසයේ සිට සහල් මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය අතර, අදාළ උපරිම සිල්ලර මිල ගණන්වලට වඩා ඉහළින් පැවතුණි. 2020 වසරේ

පොල් මිල ගණන්, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ හැසිරීම සඳහා දැඩි බලපෑමක් ඇති කරන ලදී. මෙම වසරේ මැයි සහ ජූලි හැර අනෙකුත් මාසවල දී පොල් මිල ගණන්වල ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී පැවති මිල ගණන්වලට වඩා ඉහළින් පැවතුණි. මේ හේතුවෙන්, වටප්‍රමාණය අඟල් 12ට අඩු, අඟල් 12-13 අතර සහ අඟල් 13ට වැඩි පොල් ගෙඩියක් සඳහා පිළිවෙළින් රුපියල් 60, රුපියල් 65 සහ රුපියල් 70 ලෙස උපරිම සිල්ලර මිල ගණන් 2020 සැප්තැම්බර් 25 වන දින සිට පනවන ලදී. කෙසේ වුවද, දේශීය වෙළඳපොළෙහි පවතින ඉල්ලුම සහ සැපයුම අතර පරතරය පාලනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග වල අවශ්‍යතාවය ඉස්මතු කරමින්, ඉන් අනතුරුව ද පොල් මිල උපරිම සිල්ලර මිලට වඩා ඉහළ අගයක පැවතෙමින් අඛණ්ඩව ඉහළ ගියේය. 2020 වසරේ පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලයේ දී පැවති ලොකු ළූණු මිල ගණන්, 2014 වසරේ සිට අනුරූප මාසවල දක්නට ලැබුණු මිල ගණන්වලට වඩා ඉහළින් පැවති අතර, ඉහළ මිල හේතුවෙන් පීඩාවට පත්වන පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීම සඳහා, 2020 පෙබරවාරි 23 සහ 2020 මාර්තු 18 යන දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයක් මත පිළිවෙළින් රුපියල් 190ක සහ රුපියල් 150ක උපරිම සිල්ලර මිලක් පැනවීමට රජයට සිදු විය. ඉන් අනතුරුව, ජාත්‍යන්තර වෙළඳපොළෙහි දක්නට ලැබුණු මිල ගණන් පහළ යෑම පෙන්නුම් කරමින්, දේශීය වෙළඳපොළෙහි ලොකු ළූණු මිල ගණන් 2020 අප්‍රේල් සිට ජූලි දක්වා පහළ ගියේය. පසුව, වගා හානි හේතුවෙන් දේශීය ලොකු ළූණු නිෂ්පාදිතයෙහි දක්නට ලැබුණු පහළ යෑම සහ ඉන්දියාව විසින් 2020 සැප්තැම්බර් 15 වන දින සිට ලොකු ළූණු අපනයනය තහනම් කිරීම ප්‍රධාන කොටගෙන දේශීය වෙළඳපොළෙහි ලොකු ළූණු මිල ගණන්වල වැඩිවීමක් දක්නට ලැබුණි. මේ අතර, ආනයනික ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, රුපියල් 15ක් සහ රුපියල් 50ක් ලෙස, පිළිවෙළින් 2020 මැයි 01 සහ 2020 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දමන ලදී. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගත තත්ත්වය නැවත පැනනැගීමත් සමඟ ඇති වූ අපහසුතා අවම කිරීමේ අරමුණින් රජය විසින් ආනයනික ලොකු ළූණු මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2020 ඔක්තෝබර් 14 වන දින සිට කිලෝග්‍රෑමයක් මත ශත 25ක් දක්වා පහළ දමන ලදී. මීට අමතරව, ඊජිප්තුව, තුර්කිය, පකිස්ථානය සහ නෙදර්ලන්තය වැනි රටවලින් ආනයනය කළ විවිධ තත්ත්වයන්ගෙන් යුතු ලොකු ළූණු වෙළඳපොළෙහි පැවතීම ද 2020 වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ලොකු ළූණු මිල ස්ථාවරව පවත්වා ගැනීමට දායක විය. තවද, වසර ආරම්භයේ පැවති රතු ළූණු මිල මෑත කාලයේ පෙන්නුම් කළ ඉහළම මිල වූ අතර, 2020 මැයි 22 දින ආනයනික රතු ළූණු කිලෝග්‍රෑමයක් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 50ක් දක්වා ඉහළ දැමීමක් සිදු කළ ද, 2020 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලයේ දී එම මිල ගණන් සාපේක්ෂව අඩු විය. කෙසේ වුවද, 2020 ඔක්තෝබර් සිට රතු ළූණු මිල අඛණ්ඩව ඉහළ ගියේය. පෙර වසරවලට සාපේක්ෂව අර්තාපල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතිය ද, එහි හැසිරීම පසුගිය වසර කිහිපයේ පැවති හැසිරීමට බෙහෙවින් අනුරූප විය. මේ අතර, 2020 මැයි 22 සහ 2020 අගෝස්තු 15 දිනයන්හි දී ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පිළිවෙළින් රුපියල් 50ක් සහ රුපියල් 55ක් ලෙස ඉහළ දමන ලදී. මේ අනුව, පාරිභෝගික මිල දර්ශක දෙකෙහිම නිතර මිල උච්චාවචනය වන ආහාර දර්ශක, 2020 වසරේ දී ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද එම වැඩිවීම් 2019 වසරට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි.

**ආහාර මිල ස්ථායී මට්ටමක පවත්වාගෙන යෑම සඳහා රජය මැදිහත් වුවද, පොදු මිල මට්ටම මත පීඩනයක් ඇති කරමින් නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් ආහාර අයිතමයන්හි මිල, 2020 වසරේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. පරිප්පු, සීනි,**

**4.1 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ආහාර අයිතමවල උපරිම සිල්ලර මිල**

| අයිතමය | වර්තමාන උපරිම සිල්ලර මිල (රු.) | උපරිම සිල්ලර මිල බලපැවැත්වූ දිනය |
|---|---|---|
| සහල් | | 28.05.2020 |
| සම්බා | 98.00 | |
| නාඩු | 96.00 | |
| රතු කැකුළු | 93.00 | |
| සුදු කැකුළු | 93.00 | |
| පොල් | | 25.09.2020 |
| වට ප්‍රමාණය අඟල් 12 ට අඩු | 60.00 | |
| වට ප්‍රමාණය අඟල් 12-13 අතර | 65.00 | |
| වට ප්‍රමාණය අඟල් 13 ට වැඩි | 70.00 | |
| සුදු සීනි | 85.00 | 10.11.2020 |
| ලොකු ළූණු | 150.00 | 18.03.2020 |

මූලයː පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

පොල්තෙල්, බිත්තර, හාල්පිටි, කිරිපිටි, ධාන්‍ය, කරවල, ටින් මාළු සහ කහ කුඩු ආදියෙහි විටින්විට සිදු වූ මිල වෙනස්වීම් මෙම කාණ්ඩයේ මිල හැසිරීම මත සැලකිය යුතු බලපෑමක් සිදු කරන ලදී. 2020 වසර අවසානයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය පරිප්පු මිල, 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාස හැර ඉතිරි කාලයේ දී පසුගිය වසරට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. කොවිඩ්-19 වසංගතයේ පැතිරීමත් සමඟ රටේ උද්ගත වූ තත්ත්වය තුළ පාරිභෝගිකයන්ට සහන සැලසීමක් වශයෙන්, 2020 මාර්තු 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි පරිප්පු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 65ක් සහ ටින් මාළු ග්‍රෑම් 425ක් සඳහා රුපියල් 100ක් වන ලෙස පැවති උපරිම සිල්ලර මිල ගණන්, 2020 අප්‍රේල් 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. මේ අතර, මිල පාලනයේ ආංශික බලපෑමක් පිළිබිඹු කරමින් 2020 මාර්තු හා අප්‍රේල් මාසවල දී ටින් මාළු මිල පහළ ගියේය. ආනයනික කිරිපිටි මිල ගණන් වසර පුරාවටම නොවෙනස්ව පැවති අතර, 2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි ග්‍රෑම් 400ක දේශීය කිරිපිටි පැකට්ටුවක මිල රුපියල් 345හි සිට රුපියල් 380 දක්වා ආනයනික කිරිපිටි මිලට සමාන වන ලෙස ඉහළ දමන ලදී. රට වසා දැමූ සමයේ සහන පියවරක් ලෙස 2020 මාර්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි බිත්තරයක මිල රුපියල් 10ක් දක්වා අඩු කළ අතර, මේ හේතුවෙන් 2020 වසරේ වාර්තා වූ අවම බිත්තර මිල, අප්‍රේල් සහ මැයි මාසවල දී වාර්තා විය. කෙසේ වුවද, මැයි සිට අගෝස්තු මාසය දක්වා බිත්තර මිල අඛණ්ඩව ඉහළ යෑම හේතුවෙන්, 2020 සැප්තැම්බර් 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි බිත්තරයක මිල රුපියල් 2කින් පහළ දැමීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බිත්තර මිල සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා පහළ ගිය ද, 2020 දෙසැම්බර් මාසයේ දී යළි ඉහළ ගියේය. කුකුල් මස් මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීම සඳහා රජය විසින් 2020 මාර්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි සම සහිත බ්‍රොයිලර් කුකුල් මස් සහ සම රහිත

4

**4.2 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සම්බා**




මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.3 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - පොල් (මධ්‍යම)**




මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.4 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - ආනයනික ලොකු ළූණු**




මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.5 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සීනි**




මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

බ්‍රොයිලර් කුකුල් මස් කිලෝග්‍රෑමයක් මත පිළිවෙළින්, රුපියල් 430ක් සහ රුපියල් 500ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. ඒ අනුව, කුකුල් මස් මිල 2020 අප්‍රේල් මාසයේ දී පහළ ගිය ද, මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කර, ඉන් අනතුරුව සුළු වශයෙන් පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. තවද, ප්‍රධාන වශයෙන් කුකුල් මස් මිල ඉහළ යෑම පාලනය කිරීමේ පියවරක් ලෙස, 2020 මාර්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි බඩඉරිඟු කිලෝග්‍රෑමයක මිල රුපියල් 55ක් ලෙස උපරිම සිල්ලර මිලක් පනවන ලදී. පෙර වසරවල දී සුළු වශයෙන් වෙනස් වූ කහ කුඩු මිල 2020 වසරේ දී අඛණ්ඩව ඉහළ යන ලද අතර, 2020 මැයි සිට අගෝස්තු දක්වා කාලය තුළ සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර දේශීය නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් 2019 දෙසැම්බර් 06 වන දින සිට පනවන ලද ආනයන සීමා මේ සඳහා හේතු විය. 2020 අප්‍රේල් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි කහ කුඩු කිලෝග්‍රෑමයක් මත රුපියල් 750ක උපරිම සිල්ලර මිලක් පැනවූවද, දේශීය සැපයුම සහ ඉල්ලුම අතර පැවති සැලකිය යුතු පරතරය හේතුවෙන් ඉන් පසු මාසවල දී කහ කුඩු මිල ශීඝ්‍රයෙන් ඉහළ යෑම නිසා, රජය විසින් 2020 සැප්තැම්බර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි කහ කුඩු සඳහා වූ උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. 2020 වසර පුරා තිරිඟු පිටි මිල ස්ථාවරව පැවති අතර, දේශීය වෙළඳපොළෙහි පැවති ඉහළ සහල් මිල පෙන්නුම් කරමින් 2020 මැයි සිට ඉදිරි මාසවල දී සහල් පිටි මිලෙහි වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 2020 වසරේ දී පැවති ඉහළ පොල් මිලට සමගාමීව, පොල්තෙල් මිල ගණන් 2020 වසර පුරා ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, පෙර වසරවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. 2020 වසරේ පළමු භාගයේ දී ඉහළ ගිය සීනි මිල, ඉන් පසුව සුළු වශයෙන් පහළ ගියේය. කොවිඩ්-19 වසංගතය නැවත පැනනැගීමත් සමඟ මතු වූ අපහසුතා සලකා බලමින් 2020 ඔක්තෝබර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි පරිප්පු, ටින් මාළු සහ සීනි ආදී ආනයනික අයිතම කිහිපයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, කිලෝග්‍රෑමයකට ශත 25ක් දක්වා පහළ දමන ලදී. ඒ අනුව, පාරිභෝගික මිල දර්ශක දෙකෙහිම අනෙකුත් ආහාර මිල දර්ශක 2020 වසරේ දී ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.

**2020 වසරේ සිදු කළ රට වසාතැබීමේ තත්ත්වයත් සමඟ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවා සඳහා ඇති වූ ඉල්ලුම පහළ යෑම සහ පරිපාලිත මිල ගණන් සංශෝධනය නොකිරීම හේතුවෙන්, පෙර වසරවලට වඩා වෙනස් වූ හැසිරීමක් පෙන්නුම් කළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල 2020 වසරේ විශේෂයෙන් පළමු භාගයේ දී මධ්‍යස්ථව පැවතුණි.** කෙසේ වුවද, 2020 ජනවාරි මාසයේ දී නිවාස කුලී හා ද්විතීයික අධ්‍යාපනය සඳහා වන උපකාරක පන්ති ගාස්තුවල සිදු වූ ඉහළ යෑම් හේතුවෙන්, 2019 ජනවාරි මාසයට පසුව ආහාර නොවන කාණ්ඩයේ වාර්තා වූ වැඩිම මිල ඉහළ යෑම 2020 ජනවාරි මාසයේ දී වාර්තා විය. 2020 මාර්තු මාසයේ දී වෛද්‍ය රසායනාගාර ගාස්තු ඉහළ යෑම හේතුවෙන් ඉහළ ගිය සෞඛ්‍ය උප කාණ්ඩයේ මිල ගණන්, ජූලි මස අග භාගයේ සිදු කළ පූර්ණ රුධිර පරීක්ෂණය (FBC) සඳහා වූ ගාස්තු අඩු වීමට අනුව අගෝස්තු මාසයේ දී පහළ ගිය අතර, දෙසැම්බර් මාසයේ පෙන්නුම් කළ සුළු ඉහළ යෑම වනතුරුම නොවෙනස්ව පැවතුණි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව 2020 වසර පුරා ඉන්ධන මිල ගණන් නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. මේ අතර, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම 2020 අප්‍රේල් 06 වන දින සිට පෙට්‍රල් (92 ඔක්ටේන්) ලීටරයක මිල රුපියල් 142හි සිට රුපියල් 137 දක්වා පහළ දැමූ අතර නැවත 2020 මැයි 17 වන දින එය පෙර පැවති මට්ටමට ඉහළ දමන ලදී. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පෙට්‍රල් (92 ඔක්ටේන්) මිලට සමාන වන පරිදි මිල රැගෙන එමින් ලංකා ඉන්දියන් ඔයිල් සමාගම 2020 මැයි 20 වන දින පෙට්‍රල් (92 ඔක්ටේන්) මිල රුපියල් 137ක් දක්වා නැවත පහළ හෙලන ලදී. තවද, 2020 වසර තුළ දී දුම්රිය ගාස්තු සංශෝධනයක් සිදු නොවූ අතර, කොවිඩ්-19 ප්‍රවාහන ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ, සෞඛ්‍ය අවදානම් මට්ටම සැලකිල්ලට ගනිමින් 2020 නොවැම්බර් 11 වන දින සිට බස් ගාස්තු සංශෝධනය කරන ලදී. ඒ අනුව, ආසන ප්‍රමාණයට පමණක් මගීන් රැගෙන යාහැකි මාර්ග සඳහා පැවති ගාස්තුව මෙන් 1.2 ගුණයකින් බස් ගාස්තු ඉහළ දැමීමක් සහ ආසන ප්‍රමාණයෙන් සියයට 50ක් පමණක් මගීන් රැගෙන යා හැකි මාර්ග සඳහා 1.5 ගුණයකින් බස් ගාස්තු ඉහළ දමන ලදී. කෙසේ වුවද, වසංගත තත්ත්වය සමඟ පනවන ලද දේශසීමා ආරක්ෂණ ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 මාර්තු මාසයේ සිට ගුවන් ගමන් ගාස්තු නොවෙනස්ව පැවතුණි. එසේම, කලින් කලට මිල ඉහළ යෑම් සිදුවන අධ්‍යාපන ගාස්තුවල සංශෝධනයක් මෙම වසර තුළ දී දක්නට නොලැබුණි. මේ අතර, වසංගත තත්ත්වය හමුවේ පනවන ලද සංචරණ සීමා හේතුවෙන් පීඩාවට පත් වූ මහජනතාවට සහ ව්‍යාපාරික ප්‍රජාවට සහන සැලසීමේ අරමුණින්, 2020 වසරේ දී ජල ගාස්තු, විදුලි

ගාස්තු සහ ගෘහස්ථ ගෑස් මිල ගණන්හි සංශෝධන සිදු නොකරන ලදී. තවද, තැපැල්, ස්ථාවර දුරකථන, ජංගම දුරකථන, අන්තර්ජාල සම්බන්ධතා සහ චන්ද්‍රිකා තාක්ෂණය මගින් ලබා දෙන රූපවාහිනී සේවා (Satellite TV) ගාස්තුවල සංශෝධන ද 2020 වසරේ දී සිදු නොවුණි. එමෙන්ම, අරක්කු, බියර් සහ සිගරට් මිල ගණන් 2020 වසරේ දී නොවෙනස්ව පැවති අතර, 2020 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලයේ දී පුවක් මිලෙහි සිදු වූ වැඩිවීම සමඟ එම මිල ගණන්, 2020 වසරේ දෙවැනි භාගයේ දී පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, පාරිභෝගික මිල දර්ශක දෙකෙහිම ආහාර නොවන මිල දර්ශක 2020 වසරේ දී සුළු ඉහළ යෑමක් පමණක් පෙන්නුම් කරන ලදී.

## පාරිභෝගික මිල දර්ශක

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) ජනවාරි මාසයේ දී දර්ශකාංක 137.0ක් ලෙස වාර්තා වූ අතර, අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 134.8ක් දක්වා පහළ ගොස්, ඉන් අනතුරුව 2020 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 141.2ක් දක්වා ක්‍රමයෙන් ඉහළ ගියේය.** කොවිඩ්-19 වසංගතයට පෙර 2020 ජනවාරි මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිලෙහි සිදු වූ ඉහළ යෑම් හේතු විය. ඉන් පසුව, 2020 පෙබරවාරි මාසයේ දී නොවෙනස්ව පැවති ජා.පා.මි.ද. ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි සිදු වූ පහළ යෑම් හේතුවෙන් ඊළඟ මාස දෙක තුළ දී පහළ යන ලදී. මෙම පහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින් ජා.පා.මි.ද. අප්‍රේල් සිට ජූනි මාසය දක්වා ඉහළ ගිය අතර, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මෙම ඉහළ යන ප්‍රවණතාව සඳහා පූර්ණ දායකත්වය සපයන ලදී. ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යෑම මගින් අහෝසි වී යෑම හේතුවෙන් ජූලි මාසයේ දී නොවෙනස්ව පැවති ජා.පා.මි.ද. 2020 වසරේ ඉතිරි කාලය තුළ අඛණ්ඩව ඉහළ යන ලදී. අගෝස්තු සිට නොවැම්බර් මාසය දක්වා ජා.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යෑම දායක වූ අතර, ආහාර කාණ්ඩය මගින් වැඩිම දායකත්වයක් දක්වන ලදී. මේ අතර, 2020 දෙසැම්බර් මාසයේ දී ජා.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම් පූර්ණ වශයෙන් දායක විය.

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

**2020 වසරේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 134.6 සිට 2020 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 138.0ක් ලෙස වාර්තා වූ අතර, පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී නොවෙනස්ව පැවතුණි.** ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන හේතුවෙන් කො.පා.මි.ද. 2020 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩයන්ගේ අයිතමවල මිල ගණන් වෙනස්වීම් එකිනෙකට අහෝසි

**4.6 රූප සටහන**
**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2020**




මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.7 රූප සටහන**
**කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2020**




මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වීම නිසා, 2020 පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී කො.පා.මි.ද. නොවෙනස්ව පැවතුණි. මේ අතර, 2020 මාර්තු මාසයේ දී සිදු වූ පහළ යෑමට මෙන්ම ඉන් පසුව අප්‍රේල් සහ ඔක්තෝබර් මාසවල දී සිදු වූ ඉහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන පූර්ණ වශයෙන් දායක විය. වසරේ ඉතිරි මාසවල කො.පා.මි. දර්ශකයෙහි මාසික ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යෑම් දායක වූ අතර, ආහාර කාණ්ඩය ඊට ඉහළ දායකත්වයක් දක්වන ලදී.

### නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.)

**දේශීය භාණ්ඩ නිෂ්පාදකයන්ට ලැබෙන සාමාන්‍ය මිල ගණන් මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, නි.මි.ද. (2013 සිව්වන කාර්තුව=100), සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කරමින් 2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 144.3හි සිට 2020 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 149.2ක් ලෙස වාර්තා විය.** නි.මි.ද. මගින් ආර්ථිකයෙහි කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගිතා (විදුලිය හා ජල සැපයුම) යන අංශ ආවරණය කරයි. නි.මි. දර්ශකයෙහි කෘෂිකර්මාන්ත උප දර්ශකය 2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 169.8ක් ලෙස වාර්තා වූ අතර, ඊළඟ මාස තුනේ දී එම අගය පහළ ගොස්, ඉන් පසු ක්‍රමයෙන් වැඩි වී ජූනි මාසය වන විට දර්ශකාංක 184.7ක් ලෙස පෙන්නුම් කළ අතර දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 185.1ක් ලෙස වාර්තා කළේය. මේ අතර, නි.මි. දර්ශකයෙහි නිෂ්පාදන උප දර්ශකය 2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 133.7ක් වාර්තා කළ අතර, දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 139.9ක් කරා ළඟා වූ නමුත්, ඒ අතර කාලසීමාවේ දී සැලකිය යුතු උච්චාවචන වාර්තා විය. නි.මි. දර්ශකයෙහි විදුලිය හා ජල සැපයුම් උප දර්ශකය 2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 86.7ක් වූ අතර, එය මාර්තු මාසය දක්වා ඉහළ ගොස්, අප්‍රේල් සහ මැයි මාස දක්වා පහළ යන නැඹුරුවක් පෙන්නුම් කර ඉන් අනතුරුව 2020 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 92.3ක් ලෙස ඉහළ යන ලදී.

## 4.3 වැටුප්

**කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් හේතුවෙන්, පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශවල සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යෑමක් පෙන්නුම් කළ නමුත්, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී.** කෙසේ වුවද, වසර තුළ දී පොදු මිල මට්ටම මත වැටුප් මගින් ඇති වන ඉල්ලුමෙහි පීඩනය අඩු මට්ටමක පැවතුණි.

**4.8 රූප සටහන**
**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස**




මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### පෞද්ගලික අංශයේ වැටුප්

**කොවිඩ්-19 වසංගතය පැතිරීම, විධිමත් පෞද්ගලික අංශයට අහිතකර ලෙස බලපාන ලදී.** ඒ අනුව, ව්‍යාපාර කටයුතු කෙරෙහි බාධා සිදුවීමත් සමඟ මුදල් ප්‍රවාහයන්ට ඇති වූ දැඩි බලපෑම් හේතුවෙන් ඇතැම් සමාගම්වලට සේවක වැටුප් පහළ දැමීමට සිදු විය. තවද, රාජකාරි කටයුතු අඩුවීම හේතුවෙන් නිවසේ රැඳී සිටීමට සිදු වූ සේවකයන්ට අවසන් වරට මාසිකව ගෙවන ලද මූලික වැටුපෙන් සියයට 50ක් හෝ මාසිකව රුපියල් 14,500ක් යන විකල්ප දෙකෙන්, සේවකයාට වඩාත් වාසිදායක වන ලෙස, ගෙවීම් සිදු කිරීම පිළිබඳව නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය,[3] හාම්පුතුන්ගේ සම්මේලනය සහ වෘත්තීය සමිති විසින් ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹිණි. කෙසේ වුවද, පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (1978 දෙසැම්බර්=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 0.2කින් ඉහළ යන ලදී. කර්මාන්ත හා වාණිජ සහ සේවා උප කාණ්ඩවල සේවකයන්ගේ අවම වැටුප්වල ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 4.2කින් පහළ ගියේය.

**කොවිඩ්-19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා ගත් පියවර මධ්‍යයේ ජීවනෝපායක් සලසා ගැනීමේ හැකියාව අඩාල වීම හේතුවෙන් අවිධිමත් පෞද්ගලික අංශය දැඩි ලෙස පීඩාවට පත් විය.** ඒ අනුව,

3 2020 අගෝස්තු 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි අමාත්‍යාංශයේ නම කම්කරු අමාත්‍යාංශය ලෙස වෙනස් කර ඇත.

අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල සමඟ මැයි මාසයේ දී පහළ ගිය අතර, එතැන් සිට 2020 සැප්තැම්බර් මාසය දක්වා ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. ඉන්පසුව, එය වසංගතයේ දෙවන රැල්ලත් සමඟ 2020 ඔක්තෝබර් මාසයේ දී යළිත් පහළ ගොස් 2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී නැවත යථා තත්ත්වයට පත් විය. කෙසේ වුවද, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2012=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 3.3කින් ඉහළ යන ලදී. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 2.7කින් පහළ යන ලදී.

### රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2016=100) වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 9.2කින් ඉහළ යන ලදී.** 2019 ජූලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම වැටුප සඳහා සලකා නොබලන රුපියල් 2,500ක නව මාසික අතුරු දීමනාවක් ලබා දීම සහ 2020 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි විශේෂ දීමනාවේ හා අතුරු දීමනාවේ අවසාන වාරිකය මූලික වැටුපට එකතු කිරීම, මෙම ඉහළ යෑම සඳහා හේතු විය. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 2.9කින් ඉහළ යන ලදී.

4